**පූජාපිටිය ප්‍රාදේශීය සභාව - 2022**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.7,506,175 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාළ උප ලේඛන ලැබූ පසු නිවැරදිව ගණනය කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු දායක විශ්‍රාම වැටුප් රු.49,505 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ශේෂය සැඳුම්ලත් ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා දී නොමැති බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.15,572,183 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා,ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | අදාළ භාණ්ඩ හඳුනා ගැනීමට නොහැකි වූ බව සහ ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඔප්පු සභාව සතුව නොමැති බව | උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා,ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් ලබා ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 2019 වර්ෂයෙන් පසු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 571(3) | කාලය ඉක්මවා තිබුණු රු.734,573 ක තැන්පතු ශේෂ 10ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | සභාවේ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 ක් අතුරු බදු දී තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 සැප්තැම්බර් 03 දිනැති CPC/CLG/1/7 /1/සං.විවිධ අංක දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය | කාර්යාලගතව රාජකාරියේ යෙදෙන සහ ක්ෂේත්‍ර රාජකාරී සඳහා ගමන් වියදම් ලබාගන්නා නිළධාරීන් වෙත අනුමැතියකින් තොරව රු.300 ක දෛනික දීමනාවක් ගෙවා තිබුණු අතර එසේ 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා රු.67,200 ක් ගෙවා තිබුණි. | සභාවේ සභාපතිගේ හා ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව ගෙවා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,558,476 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,337,527ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,306,980 | 4,361,957 | 4,447,458 | 3,659,235 | 5,432,980 | 5,779,759 | 4,995,307 | 3,744,736 |
| (ii) | කුලී | 5,129,648 | 4,381,873 | 4,980,127 | 298,198 | 4,694,690 | 4,838,971 | 4,517,499 | 896,452 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,702,050 | 2,485,635 | 2,485,635 | - | 2,005,200 | 980,440 | 1,243,240 | - |
| (iv) | වෙනත් ආදායම් | 25,643,240 | 13,733,285 | 30,785,522 | 15,488,533 | 22,275,000 | 19,361,802 | 23,748,841 | 32,540,770 |
| | | 37,781,918 | 24,962,750 | 42,698,742 | 19,445,966 | 34,407,870 | 30,960,972 | 34,504,887 | 37,181,958 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම්**<br>සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.3,641,267 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් බදු හිඟය රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 74 කින් එකතුව රු.842,982 ක වරිපනම් හිඟයන් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 - 35 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු යොදා ඇති බව. | හිඟ ආදායම් රැස්කළ යුතුය. |

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.528,068 ක් හා මුද්දර ගාස්තු රු.12,988,872 ක් විය. | මෙතෙක් ප්‍රතිපාදන ලැබී නොමැති බව. | අදාළ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැය ලේඛනයෙන් මාර්ග, කාණු, ගොඩනැගිලි යනාදි කාර්යයන් සඳහා වෙන් කරන ලද රු.15,575,000 ක සංවර්ධන යෝජනා 23 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු එකතුව රු.4,000,000 ක ඇස්තමේන්තුගත ව්‍යාපෘති 04 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.1,340,243 ක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම (output) අත්පත් කරගෙන නොතිබුණි. | ආර්ථික අර්බුදතාවය හේතුවෙන් අත්හිටුවීමට සිදු වූ බව. | ව්‍යාපෘතිවල වැඩ අවසන් කර උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | කසළ කළමනාකරණය සඳහා යෝජිත එනසල්මඩ ඉඩම මැනීමේ හා පවරා ගැනීමේ ගාස්තු ලෙස රු.400,000 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව වෙත 2013 වර්ෂයේදී ගෙවා තිබුණද විගණිත දින වන විටත් ඉඩම පවරාගෙන කසළ කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේදී ගැටළුකාරී තත්ත්වයක් පැන නැඟී ඇති බව. | ඉඩම පවරා ගෙන කසළ කළමනාකරණය ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | සභාවේ පුනරාවර්තන ආදායම්, මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා මහජනතාවගේ සුබ විහරණය, සුභසාධනය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා යොදවා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.41,664,404 ක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණු අතර මහජන බැංකු ජංගම ගිණුමේ රු.34,742,243 ක ශේෂයක් නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී පොදු උපයෝගීතා සඳහා යෙදවීමට අපේක්ෂා කරන බව. | අතිරික්ත මුදල් ප්‍රාදේශීය සංවර්ධනයට යොදාගත යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1994 වර්ෂයේ සිට පැවත එන රු.109,952 ක කැබ් රථ අලුත්වැඩියා ගිණුමේ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02ක එකතුව රු.11,466,468 ක් වූ අතර ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.47,918ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.1,945,067 ක් අයකර ගෙන නොතිබුණි. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.22,484,868 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් පැවති අතර ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.11,891,273 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින රු.597,804 ක් නිරවුල් කර නොතිබුණි. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.14,426,024 ක වාහන 04 ක්, යන්ත්‍රෝපකරණ 02 ක් හා වටිනාකම හඳුගත නොහැකි වාහන 01 ක් වසර 01ත් 07ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියාවන් කිරීමට හා අපහරණය කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 12 ක පුරප්පාඩු 25ක් ද එක් තනතුරක අතිරික්තතා 10 ක් ද පැවතුණි. | රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වී අතර අතිරික්ත තනතුරු සංවර්ධන නිලධාරීන් බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා කාර්යමණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාන මාරුවී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් තිදෙදෙනෙකුගෙන් රු.392,050ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | පළාත් භාණ්ඩාගාරය වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 04 ක සියයට 30 සිට සියයට 71 දක්වාද, වියදම් විෂයයන් 15 ක සියයට 65 සිට සියයට 98 දක්වා විචලනයක් නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 21 ක් සඳහා වෙන්කළ රු.2,315,000 ක ප්‍රතිපාදන විලින් කිසිදු වියදමක් දරා නොතිබුණු බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | 2022 රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි වැය පාලනය කිරීමට සිදු වූ බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ළඟාකර ගෙන නොතිබුණි. | ආර්ථික අර්බුදය හා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම කිරීමට කටයුතු කළ යුතුය. |